බලංගොඩ නගර සභාව
රත්නපුර දිස්ත්‍රික්කය

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 අප්‍රේල් 05 දින ද , ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 30 දින ද ,විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2013 නොවැම්බර් 04 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදී.

### 1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව , බලංගොඩ නගර සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට බලංගොඩ නගර සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ ප්‍රකාශ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 571 හා 572 ප්‍රකාරව ඉකුත් වූ තැන්පතු රාජ්‍ය ආදායමට ගැනීමේ දී අනුගමනය කල යුතු ක්‍රියාපටිපාටිය දක්වා තිබුණ ද ඒ පිළිබඳව අවධානය යොමු කිරීමෙන් තොරව ජර්නල් සටහන් අංක 59 මගින් රු.12,008,147 ක් වූ තැන්පත් පොදු සංචිතයට බැර කර තිබුණි.

(ආ) තානායම් ආහාරපාන විකුණුම් රු.12,065,286 ක වටිනාකම ණයගැති පාලන ගිණුම හර කර තිබුණු අතර එම මුදල් ලැබීම ණයගැති පාලන ගිණුමට බැර කර තිබුණි.

(ඇ) තානායමෙහි මාසික ආදායම් ප්‍රකාශන අනුව 2012 වර්ෂය සඳහා මුළු විකුණුම් වටිනාකම රු.14,496,353 ක් ලෙස දක්වා තිබුණු අතර අවසාන මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී මුළු විකුණුම් වටිනාකම රු.12,847,240 ක් ලෙස රු.1,649,113ක් අඩුවෙන් සටහන් කර තිබුණි.

(ඈ) ඉඩම් ගොඩනැඟිලි හා යන්ත්‍රෝපකරණ වලට අදාළව ශේෂ පත්‍රයේ වටිනාකම රු.217,773,086 වුවද ස්ථාවර වත්කම් ලේඛණය අනුව එය රු.202,690,305 ක් විය.

(ඉ) 2010 වර්ෂයේ සිට ලැබිය යුතු තානායම් ගාස්තු ලෙස ගිණුමේ දක්වා තිබුණු රු.79,713 ක් ඇති වීමට හේතුව හෝ එම වටිනාකම පියවීමට කටයුතු නොකිරීම පිළිබඳව කරුණු විගණනයට හෙළිදරව් නොවිණි.

1.3.2 විගණනයට සාක්ෂි ඉදිරිපත් නොවීම

2012 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ වටිනාකම රු. 264,739,412 ක් වූ ජර්නල් 63 ක් විගණනයට ඉදිරිපත් කර තිබුණ ද අදාල ජර්නල් සටහන් වල නිවැරදිතාවය පරීක්ෂා කිරීම සඳහා වූ ප්‍රභව ලියවිලි විගණනයට ඉදිරිපත් නොවිණි.

2. මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචන

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.2,295,804 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.10,717,758 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තු ගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | **රු. ‘000** | **රු. ‘000** | **රු. ‘000** |
| (i) | වරිපනම් හා බදු | 6,500 | 5,598 | 1,683 |
| (ii) | බදු කුලී | 17,107 | 15,783 | 1,652 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,712 | 1,712 | - |
| (iv) | වෙනත් ආදායම් | 26,018 | 21,179 | 6,264 |

2.2.2 උසාවි දඩ මුදල් හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 1,123,480 |
| (ii) | මුද්දර ගාස්තු | 4,200,000 |

2.2.3 දුරකථන සම්ප්‍රේෂණ කුළුණු ගාස්තු

---------------------------------------

සභා බල ප්‍රදේශය තුල 2006 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා දුරකතන සම්ප්‍රේෂණ කුළුණු 03ක් ස්ථාපිත කර තිබුණ ද අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර වාර්ෂික බලපත්‍ර ගාස්තුවක් අයකිරීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි.

2.3 අවිධිමත් ගනුදෙනු

----------------------

(අ) පළාත් පාලන කොමසාරිස්ගේ 1984 නොවැම්බර් 20 දිනැති අංක 19 දරන පළාත් පාලන ආයතන වල සහ සංවර්ධන සභාවල ආදායම් එකතු කිරීම හා හිඟ ආදායම් එකතු කිරීම නමැති චක්‍රලේඛයේ සහ 1993 ඔක්තෝබර් 19 දිනැති පලාත් පාලන කොමසාරිස් (සබරගමුව) විසින් නිකුත් කර ඇති පලාත් පාලන ආයතන වල වරිපනම් බදු සහ අක්කර බදු එකතු කිරීම සඳහා කාර්යාල වේලාවෙන් බැහැරව කාර්යාල නිලධාරීන් කොමිස් පදනම මත සේවයේ යෙදවීම යන චක්‍රලේඛ උපදෙස් වලට පටහැනිව සමාලෝචිත වර්ෂයේදී ආදායම් පරීක්ෂක වෙත අවස්ථා 04 කදී එකතුව රු. 67,772 ක් ගෙවා තිබුණි.

(ආ) 2010 ජනවාරි 28 දින පැවැත්වූ මහා සභා රැස්වීමේදී සභාපතිවරයාගේ නිල වාහනය සඳහා මාසිකව ඩීසල් ලීටර් 500ක උපරිමයක් තීරණය කර තිබුණි. එහෙත් 2013 ජනවාරි මස සිට මැයි මස දක්වා මාස 05 කදී අනුමත ඉන්ධන සීමාව ඉක්මවා රු. 181,375 ක් වටිනාකම වූ ඉන්ධන ලීටර් 1496.5 ක් භාවිතා කර තිබුණි.

(ඇ) නගර සභා සීමාව තුල මාර්ග නඩත්තු කිරීමේ කටයුතු සඳහා ලෙලන තලනය සැපයීම වෙනුවෙන් 2012 වර්ෂයේ දී අවස්ථා 02 කදී රු.77,500 ක් ගෙවා තිබුණු අතර එම ලෙලන තලනය යොදාගත් කර්මාන්ත මොනවාද යන්න විගණනයට නිරීක්ෂණය නොවිය.

2.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

--------------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 1998 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා අනුමත කරන ලද ඉදිකිරීම් 1243 කින් ඉදිකිරීම් 65 ක් සඳහා පමණක් අනුකූලතා සහතික ලබා ගෙන තිබුණි. මේ නිසා ඉදිකිරීම් සුපරීක්ෂණය ඉතාමත් දුර්වල මට්ටමක විය.

(ආ) එකතුව රු. 727,727 ක් වටිනාකමකින් යුත් බැංකු ගිණුම් 03 කට අදාල ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ චෙක්පත් 20 ක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 396 අනුව කටයුතු කර නොතිබුණි.

(ඇ) තානායමෙහි ණයගැති ලෙජරය අනුව 2012 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ණයගැති ශේෂය රු.669,230 ක් විය.

(ඈ) බස් නැවතුම්පල සහිත වෙළඳ සංකීර්ණය ඉදිකිරීම සඳහා දේපළ ණය හා සංවර්ධන අරමුදලින් ලබා ගත් රු.111,209,828 ක් වූ ණය මුදලින්, 2008 පෙබරවාරි 11 දින රු.20,000,000 ක් ගෙවා තිබුණු අතර 2013 ජූනි 30 හිඟ ණයවාරික රු.39,057,510ක් සහ හිඟ පොලිය රු.38,651,804 ක් විය.

3. පද්ධති හා පාලන
--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) අභ්‍යන්තර පාලනය
(ඈ) ආදායම් පරිපාලනය
(ඉ) වත්කම් කළමනාකරණය